**හෝමියෝපති වෛද්‍ය සභාවේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2023 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා**

---

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2023ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්වයක් වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍යප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2023 හා 2024 ගිණුම් වර්ෂයන්ට අදාලපාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශනහා කෙටුම්පත් වාර්ෂික වාර්තා2025 ඔක්තෝබර් 24 දින වන විටත් විගණකාධිපතිවෙත ඉදිරිපත් කර නොතිබුණි. | හෝමියෝපති වෛද්‍ය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ගණකාධිකාරීවරයෙකු හා ගිණුම් අංශයට අනුමත කාර්ය මණ්ඩලයක් නොමැති බවත් සියලුම ගිණුම් කටයුතු දේශීය වෛද්‍ය අංශය මඟින් සිදුවන බවත් අවසන් ගිණුම් පිළියෙල කිරීම එම අංශය මඟින් සිදු නොකිරීම නිසා බාහිර පාර්ශවයක්මඟින් අවසන් ගිණුම් පිළියෙල කිරීම හේතුවෙන් ඔවුන් විශාල කාලයක් ලබා ගත් බැවින් ගිණුම් පිළියෙල කිරීම ප්‍රමාද වී තිබූ බව හා 2023 සැප්තැම්බර් 08 වන දින වෛද්‍ය සභාවේ ධුර කාලය අවසන් වීම හේතුවෙන් ගිණුම් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තීරණ ගැනීමටනැවත වෛද්‍ය සභාවක් පිහිටුවන තෙක් ප්‍රමාද වීම හේතු වී ඇති බව. | මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා නියමිත දිනට විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

**2.2 2022 දෙසැම්බර් 31 දිනට පැවති වත්කම්, වගකීම්,ආදායම් හා වියදම් තත්ත්වය**

සභාව විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2022 දෙසැම්බර් 31 දිනටවූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම**<br>**රු.** |
|---|---|
| ජංගම නොවන වත්කම් | 11,265,459 |
| ජංගම වත්කම් | 3,835,065 |
| **මුළු වත්කම්** | **15,100,524** |
| **හිමිකම්** | **11,400,430** |
| ජංගම නොවන වගකීම් | - |
| ජංගම වගකීම් | 3,700,094 |
| **මුළුහිමිකම් හා වගකීම්** | **15,100,524** |
| මුළු ආදායම | 38,130,740 |
| මුළු වියදම | 37,229,961 |
| **අතිරික්තය** | **900,779** |

**2.3 ගෙවීම් වවුචර්පත්ඉදිරිපත් නොකිරීම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| හෝමියෝපති වෛද්‍ය සභාවේ2023 වර්ෂයේ අගෝස්තු මස සිට දෙසැම්බර් මස දක්වා ගෙවීම් වවුචර්පත් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණු බැවින් ඊට අදාල ගනුදෙනු වල වර්ගීකරණය, නිවැරදිබව, සම්පූර්ණබව හා අනුමැතිය පිළිබඳව තහවුරුවක් විගණනය වෙත ලබා ගැනීමට නොහැකි විය. | හෝමියෝපති වෛද්‍ය සභාව වෙත ගණකාධිකාරීවරයෙකු නොමැති බැවින්සභාවේ සියළුම ගිණුම් කටයුතු දේශීය වෛද්‍ය අංශයේ ගිණුම් අංශය හරහා සිදු වන බවත්, වවුචර්පත් සියල්ල දේශීය වෛද්‍ය අංශයේ පැවති බව හාසභාව විසින් මෙම වවුචර්පත් විගණනය වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලුම් කළද දේශීය වෛද්‍ය අංශයේ ගිණුම් අංශය විසින් වවුචර්පත් ඉදිරිපත් නොකිරීම මෙයට හේතු වී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කාලපරිච්ඡේදයට අදාල ගෙවීම් වවුචර්පත්විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 16 වගන්තිය | 2023 වර්ෂයට අදාලව සේවා නියුක්තයන්ගේ භාරඅරමුදල් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් 2024වර්ෂය තුළ එකතුවරු.13,565ක අධිභාරයක් ගෙවා තිබුණි. | එම කාලය තුළදී, රටේ පැවති වාතාවරණය සහ ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට තිබූ අපහසුතාවය හේතුවෙන් මෙය සිදු වී ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව සේවා නියුක්තයන්ගේ භාරඅරමුදල් නියමිත දිනට ගෙවීම් කළ යුතුය. |
| (ආ) | 2016 අංක 10 දරන හෝමියෝපතිපනත (i) 9 වගන්තියේ (4) උප වගන්තිය | සභාවේ කාලය ඉකුත් වීමට යටත් පිරිසෙයින් මාස තුනකටවත් පෙර සාමාජිකයින් තෝරා ගැනීම හා පත් කිරීම සිදු කරනු ලැබිය යුතු වුවද,නිල කාලය 2023 සැප්තැම්බර් 08 දිනෙන් අවසන් වූපෙර පැවති සභාව සඳහානව සාමාජිකයන් පත් කර තිබුණේ සභාවේ කාලය ඉකුත්වීමෙන් මාස 10කට පසු 2024 ජුලි 05 දිනදීය. | හෝමියෝපති වෛද්‍ය සභාවට සහා සාමාජිකයින් පත් කිරීම සඳහා නිලවරණය පැවැත්වීම, සාමාජිකයින් පත් කිරීම ආදී සියළුම කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය, විෂයභාර අමාත්‍යවරයා සහ සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා මඟින් සිදු වන අතර එම ප්‍රමාද වීම සඳහා වෛද්‍ය සභාවේ තීරණ හෝ මැදිහත් වීම් සිදු වී නොමැති බව. | පනත ප්‍රකාරව සභාවේ කාලය ඉකුත් වීමට පෙර සාමාජිකයින් තෝරා ගැනීම හා පත් කිරීම සිදු කරනු ලැබිය යුතුය. |
| | (ii) 15 වගන්තියේ(ඉ) උප වගන්තිය | හෝමියෝපති වෛද්‍යක්‍රමයටප්‍රතිකාරලබා දෙන හෝමියෝපතිආයතන නියාමනයට අදාලව අවම ප්‍රමිතීන් තීරණය කර ඒ අනුව එම ආයතන නියාමනයට හා පාලනයට අවශ්‍ය පියවර මේ දක්වා ගෙන නොතිබුණි. | හෝමියෝපති ආයතන පිහිටුවීම සඳහා එවකට රටෙහි පැවති වාතාවරණයට අනුව, ප්‍රතිපාදන වෙන් නොවීම මත මෙය සිදු වී තිබුණද, හෝමියෝපති ප්‍රතිකාර ලබා දෙන නිදහස් වෛද්‍ය ආයතනයන් පිහිටුවීම අවම පහසුකම් යටතේ වුවද සිදු කරන ලද බව හා පෞද්ගලික ප්‍රතිකාර ලබා දෙන හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථාන ලියාපදිංචිය ආරම්භ කර ඇති අතර | සභාව විසින් හෝමියෝපති ආයතන නියාමනයට අදාලව අවම ප්‍රමිතීන් තීරණය කර ඒ අනුව එම ආයතන නියාමනයට හා පාලනයට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඒවා නියාමනය මේ වන විටත් සිදු වෙමින් ඇති බව. | |
| (iii) 16(අ)වගන්තිය | හෝමියෝපති ඖෂධවේදීන් හා හෙදියන් හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචි කළ යුතු වුවද, මේ දක්වා එම ඖෂධවේදීන් හා හෙදියන්ලියාපදිංචි කිරීමට නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. | හෝමියෝපති ඖෂධවේදීන් හා හෙදියන් ලියාපදිංචිය සඳහා ලියාපදිංචි ලේඛනයක් සකසා ඇති නමුත් මේ වන තෙක් සුදුසුකම් ලත් හෝමියෝපති ඖෂධවේදීන් හා හෝමියෝපති හෙදියන් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර නොමැති බැවින් ලියාපදිංචිය සිදු කිරීමට නොහැකි වී ඇති බව. | හෝමියෝපති ඖෂධවේදීන් හා හෙදියන් සභාවේ ලියාපදිංචිකිරීමේ නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) 16(ග) වගන්තිය | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුකූලව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම සඳහා හෝමියෝපති වෛද්‍ය සභාවට වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති බැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත විශ්ව විද්‍යාලයක් සමඟ සම්බන්ධ වී හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීමට සාකච්ඡා සිදු වෙමින් පවතින බව. | පනත ප්‍රකාරව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |
| (v) 30(4) වගන්තිය | නියමිත දිනයේ සිට වසර 03 ක කාලයක් තුළ අවස්ථා 03 කදී පමණක්හෝමියෝපති වෘත්තිකයෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා ප්‍රවීණතාව පරීක්ෂා කිරීම සඳහා ලිඛිත පරීක්ෂණයක් පැවැත්විය යුතු වුවද, වසර 08 ක කාලයක් තුළ අවස්ථා 02 කදී පමණක් එම පරීක්ෂණය පවත්වා තිබුණි. | පෙර පැවති වෛද්‍ය සභාව මගින් අවස්ථා දෙකකදී විභාගය පවත්වන ලද නමුත් තෙවන විභාගය පැවැත්වීමට පෙර සභාවේ ධූර කාලය අවසන් වූබව හා නව වෛද්‍ය සභාව යටතේ එම විභාගය පැවැත්වීමට සියළු කටයුතු සූදානම් කර ඇති බව. | නියමිත කාලය තුළ හෝමියෝපති වෘත්තිකයෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය පරීක්ෂණපැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi) 31 (1) උප වගන්තිය | හෝමියෝපති ඖෂධවේදීන් ලියාපදිංචිකිරීම සඳහා හෝමියෝපති ඖෂධවේදී ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළයුතු වුවද, මෙම විධිවිධාන ක්‍රියාත්මකකිරීම සඳහා වූ රෙගුලාසිසම්පාදනය කර නොතිබීම හේතුවෙන් 2025ඔක්තෝබර්10 දින වනවිටත්එවැනි ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | රෙගුලාසි සකස් කිරීම බොහෝ දුරට අවසන් වී ඇති නමුත් ලියාපදිංචිය සඳහා සුදුසුකම් ලද ඖෂධවේදීන් ඉදිරිපත් නොවීම නිසා මෙම ලේඛනය අක්‍රියව පවතින බව. | රෙගුලාසි සකස් කර ඖෂධවේදීන් ලියාපදිංචිය සඳහා කටයුතු සිදු කළ යුතුයි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ | | | |
| (i) 10.1වගන්තිය | රාජ්‍ය සේවයේ තනතුරකට නිළධාරියෙකු තෝරාගෙන ඇති කල්හි 169 ආකෘතිය සම්පූර්ණ කර අදාල වෛද්‍ය වාර්තාව ලබා ගැනීමට වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් වන ලෙස ආයතන ප්‍රධානියා නියම කළ යුතු වුවද,ස්ථිර පත්වීම් ලබා ඇති වෛද්‍ය නිළධාරීන් 05 දෙනෙකුගේ, කළමනාකරණ සහාකාරවරයෙකුගේ, ඖෂධ සංයෝජකයෙකුගේ හා කාර්යාල කාර්ය සහායකවරයින් 04 දෙනෙකුගේවෛද්‍ය වාර්තා අදාලපෞද්ගලික ලිපිගොනු තුළ ඇතුළත් කර නොතිබුණි. | මෙම සේවක මණ්ඩලයේ තනතුරු ස්ථිර කිරීම ප්‍රමාද වීම හේතුවෙන් වෛද්‍ය පරීක්ෂණ පවත්වා නොතිබුණු බව හා එම පරීක්ෂණ කඩිනමින් සිදු කරන බව. | ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ii) 10.6වගන් තිය | රාජ්‍ය සේවයේ තනතුරකට පත් වී ඇති නිලධාරියෙකු එවැනි තනතුරකට පත් වී මසක් ඇතුළත ලබා දිය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 7 වන උප ලේඛනයේ නියමයන් ප්‍රකාරව ලබා දෙනු | එම ලේඛන වහාම පෞද්ගලික ලිපිගොණුවට ඇතුළත් කිරීමට ලේඛකාධිකාරීතුමිය වෙත උපදෙස් ලබා දී ඇති බව. | ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | ලබන ප්‍රතිඥා හෝ දිවුරුම,ස්ථිර පත්වීම් ලද වෛද්‍ය නිළධාරීන් 04 දෙනෙකුගේ,කළමනාකරණ සහකාරවරයෙකුගේ හා ඖෂධ සංයෝජකයෙකුගේ පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් වී නොතිබුණු අතර වෛද්‍ය නිළධාරීන් 05ක්,ඖෂධ සංයෝජකයින් 04 ක් හා කාර්යාල කාර්ය සහයකවරයින් 03 දෙනෙකුගෙන් ලබාගෙන තිබූ දිවුරුමෙහි දිවුරුම ලබා ගත් තැනැත්තා විසින් සම්පූර්ණ කර අත්සන් කර නොතිබීම හේතුවෙන් බලාත්මක වී නොතිබුණි. | | |
| (iii) | 16.1 වගන්තිය | සේවයෙහි ස්ථිරකිරීම, උසස් කිරීම හා කාර්යක්ෂමතා කඩඉම්වලින් උසස් කිරීම ආදී විභාග නියමිත දිනවල පැවැත්වීමට ආයතනප්‍රධානී වගබලා ගතයුතු වුවත්,2015වර්ෂයේ සිට 2022දක්වා බඳවාගෙන තිබුණු තනතුරු 02 කට අදාලව නිලධාරීන් 11දෙනෙකු වෙනුවෙන් විගණිත දිනය වූ 2025ඔක්තෝබර් 10දින වනවිටත් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එම නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීමට නොහැකි වී තිබුණි. | කාර්යක්ෂමතා කඩඉම් විභාගය, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විභාග අංශය මගින් පැවැත්වීම සඳහා වෛද්‍ය සභාව මගින් අනුමත කර ඊට අදාල සියළුම කටයුතු සූදානම් කර ඇති බවත්, විභාග අයදුම්පත් පුරවා අවසන් කර ඇති නමුත් වෛද්‍ය සභාවේ ගෙවීම් කටයුතු සිදු කරනු ලබන්නේ දේශීය වෛද්‍ය අංශය මගින් වන බැවින් එම විභාගය පැවැත්වීමට අවශ්‍ය ගෙවීම් මේ වන තෙක් අනුමත කර නොමැති බැවින් එම විභාගය ප්‍රමාද වී ඇති බව. | ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරනරාජ්‍යවයා පාර චක්‍රලේඛය මගින් ප්‍රකාශිත | ගිණුම්වර්ෂය අවසන් වී මාස 5 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා විගණකාධිපති වාර්තාව ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවද 2022 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 2025 | හෝමියෝපති වෛද්‍ය සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ ගණකාධිකාරීවරයෙකු නොමැති බැවින් අවසන් ගිණුම් පිළියෙල කිරීම බාහිර පාර්ශවයක් මගින් | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | |
|---|---|---|
| රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය | සැප්තැම්බර් 26 දින වන විටත් සභාගත කර නොතිබුණි. | සිදු කිරීම හේතුවෙන් ඔවුන් විශාල කාලයක් ලබා ගෙන ඇති බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 පෙබරවාරි18 දින පැවති සභා රැස්වීමේදීහෝමියෝපති ඖෂධ සංයෝජකයින්බඳවා ගැනීම සඳහා වනNVQපාඨමාලා ආරම්භ කිරීම සඳහා තීරණය කර තිබුණද මේ දක්වා එය ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම පාඨමාලා සඳහා විෂය නිර්දේශය සකසා ජාතික වෘත්තීය සුදුසුකම් ආයතනය අනුමත කර ඇති අතර පාඨමාලාව පැවැත්වීම සඳහා බාහිර ආයතන 3ක් තෝරාගෙන මේ වන විට එම සාකච්ඡා අවසන් අදියරේ පවතින බව. | තීරණය කරනු ලබන කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකාවේ හෝමියෝපතිවෛද්‍යවරයෙකු ලෙස අය කරනු ලබන ලියාපදංචි කිරීමේ ගාස්තුව රු.150ක් හා ඒ සඳහා වාර්ෂිකව අය කරන ගාස්තුව (Annual Fee) රු. 50 වූ අතර එය වර්තමාන කාලයට ගැලපෙන ලෙස සංශෝධනය කිරීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | එම සංශෝධන සඳහා රෙගුලාසි සකස් කර ගැසට් කිරීමේ කටයුතු සඳහා දේශීය වෛද්‍ය අංශය වෙත යොමු කර ඇති බව. | අය කරනු ලබන ගාස්තු කාලීන වශයෙන්සංශෝධනය කළ යුතුයි. |
| (ඇ) | 2022 වර්ෂයේ දී සායන අධීක්ෂණය කිරීම සඳහා CCTV පද්ධතියක් ස්ථාපිත කිරීමට තීරණය කර තිබුණද මේ දක්වා එය ස්ථාපිත කර නොතිබුණි. | ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් මෙම තීරණ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති නමුත් ප්‍රමාණවත් ප්‍රතිපාදන ලැබුණු විගස මෙම තීරණය ක්‍රියාත්මක කරන බව. | තීරණය කරනු ලබන කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

**3.2 මානව සම්පත් කළමණාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෛද්‍ය සභාව මඟින් මෙහෙයවනු ලබන රජයේ හෝමියෝපති සායන 14ක් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන අතර ඉංගිරිය, මඩකලපුව හා රත්ගම සායන තුනට අත්‍යවශ්‍ය වෛද්‍ය නිලධාරීන් නොමැති වීම හේතුවෙන් අනෙක් සායන වල වෛද්‍ය | සායන වල පුරප්පාඩු වූ වෛද්‍ය නිලධාරී තනතුරු සඳහා නැවත බඳවා ගැනීම අනුමත කිරීම ප්‍රමාද වීම මේ සඳහා හේතු වී ඇති බව. | පුරප්පාඩු වූ වෛද්‍ය නිලධාරී තනතුරු සඳහා ප්‍රමාද වීමෙන් තොරව බඳවා ගැනීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිලධාරීන් හට එම සායන වල රාජකාරීද ඉටු කිරීමට සිදු වී තිබුණි. | | |
| (ආ) | 2024 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්යමණ්ඩලය 48ක් වුවද තථ්‍යකාර්යමණ්ඩලය 31 ක් විය.රෙජිස්ටාර් තනතුර 2021 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින අතර වෛද්‍ය නිලධාරී තනතුරු 03ක් භාඕෂධ සංයෝජක තනතුරු09 ක් 2022 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි. | මෙම බඳවාගැනීම සිදු කිරීමට අනුමැතිය සඳහා යොමු කර ඇති නමුත් එම අනුමැතියන් ලබා නොදීම නිසා ප්‍රමාදයන් සිදු වී ඇති බව. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා නොපමාව බඳවා ගැනීම් සිදු කිරීමටත් අනුමත කාර්යමණ්ඩලය සමාලෝචනය කර යාවත්කාලීන කිරීමටත් පියවර ගත යුතුය. |